සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:................................................................ විභාග අංකය:................................................................

## I කොටස

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "ස්වාමීන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව" මෙසේ ප්‍රකාශ කළේ,
    1. ශු. ස්නාවක ජුවාම් තුමා.
    2. ශු. ස්තේපන් තුමා.
    3. ජේසුස් වහන්සේ.
    4. ශු. පේදුරු තුමා.

02. දේව මැවිල්ල පිළිබඳ මිනිසා සතු ප්‍රධාන වගකීම් වන්නේ,
    1. ගස් වැල් සිටුවීම හා ගල්වැටි දැමීම.
    2. සියලු සතුන් පාලනය කිරීම හා රැක බලා ගැනීම.
    3. දේව මැවිල්ල ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම.
    4. ඇළ දොළ ගංගාවලට කුණු කසල නො දැමීම.

03. "ජුදෙව්වරුන්ට රජව උපන් උතුමාණෝ කොතැන්හි ද? අපි එතුමාණන්ගේ තාරකාව පෙරදිග දී දැක එතුමාණන්ට නමස්කාර කරනු පිණිස ආවෙමු." මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?
    1. හෙරොද් රජු දේව දූතයාට.
    2. දේව දූතයා මරිය තුමියට.
    3. අණ බෙරකරු එඬේරුන්ට.
    4. ශාස්තවන්තයෝ හෙරොද් රජුට.

04. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන දෙක වන්නේ,
    1. සමඟි සන්ධානය හා රෝගීන්ගේ ආලේපය.
    2. සමඟි සන්ධානය හා පූජකවරය.
    3. දිව්‍ය සත්ප්‍රසාදය හා රෝගීන්ගේ ආලේපය.
    4. ප්‍රසාද ස්නාපනය හා ආශිර්වාදකාර බන්ධනය.

05. ක්‍රිස්තුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන වන්නේ,

    A - දිව්‍ය සත්ප්‍රසාදය     B - පූජකවරය
    C - ආශිර්වාදකාර බන්ධනය     D - සමඟි සන්ධානය

    මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
    1. A හා C ය.
    2. B හා D ය.
    3. C හා D ය.
    4. A හා B ය.

06. අසභ්‍ය වචන කතා කිරීම අසභ්‍ය දේ බැලීම වැනි දෑ නොකර පිරිසිඳු හිතක් හා යහපත් චරිතයක් ගොඩනගා ගත යුතු බව අපට පෙන්වා දෙන දේව පනත් වන්නේ,

A - 6 වන පනත | B - 9 වන පනත
C - 8 වන පනත | D - 10 වන පනත

1. A හා C ය.
2. B හා D ය.
3. A හා B ය.
4. C හා D ය.

07. පළමු දේව පනත ආරක්ෂා කිරීමට කළ යුත්තේ,

1. සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම.
2. සත්ව රූපවලට වන්දනා කිරීම.
3. සාන්තුවරයන්ට හා ශු. ත්‍රිත්වයට වන්දනා කිරීම.
4. ගස් කොළන්වලට හා ප්‍රතිමාවලට වන්දනා කිරීම.

08. සබත් දින ශුද්ධවන්ත ලෙස ගත කිරීමට අප කළ යුත්තේ,

1. දේවස්ථානය තුළ ගෞරවාන්විතව වන්දනාවට සම්බන්ධ වීම.
2. ඉරු දිනවලත් ණය මංගල්‍ය දිනවලත් මුළු දිව්‍ය පූජාවට සහභාගි වීම.
3. දිව්‍ය පූජාවට නොගොස් උපකාර පන්තිවලට ගොස් හොඳින් ඉගෙන ගැනීමයි.
4. සුව මෙහෙයන්වලට නොවරදවා ම සහභාගි වීමයි.

09. තමන්ව මරණයට පත් කරන්නට උත්සහ කළ අලි අග්ගා නැමැති අයට පවා සමාව දුන් මුනිතුමා වන්නේ,

1. ශු. ජුසේවාස් මුනිතුමා.
2. ශු. අන්තෝනි මුනිතුමා.
3. ශු. දෙවන ජුවාම් පාවුළු තුමා.
4. ශු. සෙබස්තියන් මුනිතුමා.

10. පැරණි ගිවිසුමේ සඳහන් යාච්ඤා පොත වන්නේ,

1. උත්පත්ති.
2. නික්ම යාම.
3. නෙහෙමියා.
4. ගීතාවලිය.

11. නික්මයාම පොතේ අඩංගු කරුණු වන්නේ,

A - සීනයි කන්දේ දී දස පනත ලබා දීම. | B - දෙවියන් වහන්සේ ලොව මැවීම.
C - මෝසෙස් තුමාගේ දූත මෙහෙවර. | D - මිනිසා පාපයට වැටීම.

1. B හා D ය.
2. C හා D ය.
3. A හා C ය.
4. A හා B ය.

12. ජුදා සිරිතට අනුව ජේසුස් වහන්සේගේ දෙමව්පියෝ අවුරුදු පතා පාස්කු මංගල්‍යයට ගිය ස්ථානය

1. ජෙරුසලම.
2. බෙත්ලෙහෙම.
3. මිසරය.
4. රෝමය.

13. ප්‍රසාද ස්නාපනයේ දී ශුද්ධාත්ම වරම ලැබීම සඳහා භාවිත වන සංකේත වන්නේ,

1. පාස්කු ඉටි පහන.
2. ශු. තෛලය.
3. සුදු වස්ත්‍රය.
4. ජලය.

14. තමන් සෑදූ රන් රූපය ඉවත ලා සැබෑවූ එකම දෙවියන් වහන්සේට වන්දනා කරන්නට පටන් ගත් රජතුමා වන්නේ,

1. නෙබුකද්නසර් රජු.
2. දාවිත් රජු.
3. සලමොන් රජු.
4. හෙරොද් රජු.

15. ''ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා ..............................''
හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

1. ප්‍රේම කරන්න.
2. වෛර කරන්න.
3. යාච්ඤා කරන්න.
4. එකට එක නොකරන්න.

16. පාසල තුළ සත්‍යගරුක ජීවිතයක් ගත කිරීමට ඔබ කළ යුත්තේ,

1. පරිත්‍යාගශීලි වීම.
2. අවංක වීම.
3. කැපවීම.
4. කීකරු වීම.

17. ශුද්ධවන්තයන් අතර උසස් ම ගෞරවය හිමිවන්නේ,

1. මරිය තුමියට.
2. ශු. පේදුරු තුමාට.
3. ශු. ජුසේතුමාට.
4. ශු. සෙබස්තියන් මුනිතුමාට.

18. ශු. මාක් ශුභාරංචි ග්‍රන්ථයේ සංකේතය වන්නේ,

1. සිංහයා.
2. මිනිසා.
3. ගවයා.
4. රාජාලියා.

19. දෙවියන් වහන්සේ පස්වන දවසේ මවන ලද්දේ,

1. ඉර, හඳ හා තාරකා.
2. සතුන් හා මිනිසා.
3. අහස හා ජලය.
4. පක්ෂීන් හා මසුන්.

20. ''ඔබ යාච්ඤා කරන කළ මෙසේ කියන්න'' මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,

1. මරිය තුමිය.
2. එළිසබෙත් තුමිය.
3. ජේසු සමිඳුන්.
4. අපෝස්තුළුවරුන්.

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරාගත් අනික් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

01. නිරතුරු යාච්ඤාව ජීවිත පුරුද්දක් කර ගැනීම සඳහා ගුරුතුමාගේ මග පෙන්වීම යටතේ ඔබ කළ ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. යාච්ඤාව ජීවිත පුරුද්දක් කර ගැනීම සඳහා ඔබ කණ්ඩායම ඇගයීම සඳහා උපයෝගී කර ගත් පොත් දෙකක් නම් කරන්න. (ල. 02)
2. එදිනෙදා ජීවිතයේ දී ඔබ පොදු යැදුම් භාවිත කරන අවස්ථා තුනක් ලියන්න. (ල. 03)
3. යාච්ඤා වර්ග තුනක් ලියන්න. (ල. 03)
4. පොදු යැදුම්වල ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)
5. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා පහක් ලියන්න. (ල. 05)

02.
1. පංච පුස්තකයේ අඩංගු පොත් හතරක් නම් කරන්න. (ල. 02)
2. ඔබට හිමි විශේෂ හැකියා තුනක් ලියන්න. (ල. 03)
3. එකිනෙකාට ගරු කරමින් සහයෝගයෙන් හා සමගියෙන් තම පවුල තුළ කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ල. 06)

03.
1. දෙවියන් වහන්සේ ආදම් සහ ඒව පදිංචි කළ උයන නම් කරන්න. (ල. 02)
2. දේව මැවිල්ලෙන් මිනිසාට ඇති ප්‍රයෝජන තුනක් ලියන්න. (ල. 03)
3. දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ග තුනක් ලියන්න. (ල. 06)

04.
1. එක් වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධාන දෙකක් ලියන්න. (ල. 02)
2. ශු. සභාවේ ශික්ෂා පද තුනක් ලියන්න. (ල. 03)
3. ඔබගේ නිවස අසල සිටින අසාධ්‍ය රෝගියෙකු වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ල. 06)

05.
1. ගාබ්‍රියෙල් දේව දූතයා විසින් මරියතුමියට මංගලම් කීම තුළින් නිර්මාණය වූ යාච්ඤාව නම් කරන්න. (ල. 02)
2. දේව මාතාවන් දර්ශනය වූ අවස්ථා තුනක් සඳහන් කරන්න. (ල. 03)
3. දේව මාතාවන්ගේ උතුම් ගුණාංග තුනක් විස්තර කර දක්වන්න. (ල. 06)

06.
1. සේවය සඳහා ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න. (ල. 02)
2. පූජා ප්‍රසාදීතුමන්ලාගේ සේවාවන් තුනක් නම් කරන්න. (ල. 03)
3. දෙමව්පියන් උදෙසා ඔබට කළ හැකි කාර්යයන් හයක් ලියන්න. (ල. 06)

07.
1. ස්වාමිවාක් ආරාධනාවේ අඩංගු ප්‍රශංසාත්මක පැතුම් දෙකක් ලියන්න. (ල. 02)
2. ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලද වරප්‍රසාද තුනක් ලියන්න. (ල. 03)
3. ඔබට සතුරුකම් කරන අයට දේව ආශිර්වාදය පතා කෙටි යැදුමක් ලියන්න. (ල. 06)